**ශීර්ෂ - 270 අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2014 වර්ෂය**

මෙම වාර්තාවේ 1 ඡේදයේ සිට 2 ඡේදය දක්වා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගිණුම් පිළිබද පොදු තොරතුරු ඇතුළත් කර ඇති අතර 3 ඡේදයේ සිට ශිර්ෂයට අදාල විගණන නිරීක්ෂණ දැක්වේ.

## 1. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශිය ලේකම් කාර්යාල

| | | | | | |
|---|---|---|---|---|---|
| (i) | අම්පාර | (viii) | කල්මුණේ - මුස්ලිම් | (xv) | පදියතලාව |
| (ii) | අඩ්ඩාලච්චේන | (ix) | කරතිව් | (xvi) | සයින්දමරදු |
| (iii) | අක්කරපත්තුව | (x) | ලාහුගල | (xvii) | සමන්තුරෙයි |
| (iv) | දෙහිඅත්තකණ්ඩිය | (xi) | මහඔය | (xviii) | තිරික්කෝවිල් |
| (v) | අල්යාඩිවෙම්බු | (xii) | නින්දවූර් | (xix) | කල්මුණේ - දෙමළ |
| (vi) | දමන | (xiii) | නාවිදන්වෙලි | (xx) | උහන |
| (vii) | ඉරක්කාමම් | (xiv) | පොතුවිල් | | |

### 1.1 විගණන විෂය පථය

අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර් ගත වූ විසර්ජන ගිණුම හා රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2015 අගෝස්තු 11 දින දිස්ත්‍රික් ලේකම් වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ හා ගණන්දිමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරින්ගේ හා ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන

අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2. ගිණුම්

### 2.1 විසර්ජන ගිණුම

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 1,055.99 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,055.73 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරිවීම් රු.මිලියන 0.26 ක් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 0.02 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2014 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | |
| පුනරාවර්තන | 654.79 | 654.77 | 0.02 | 0.00 |
| මූලධන | 401.20 | 400.96 | 0.24 | 0.06 |
| **එකතුව** | **1,055.99** | **1,055.73** | **0.26** | **0.03** |

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

සමාලෝචිත වර්ෂයේදී විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 05 ක් හා දෙපාර්තමේන්තු 02 ක් විසින් එකතුව රු.මිලියන 502.66 ක ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබුණු අතර එම ප්‍රතිපාදන උපයෝජනය කිරීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ප්‍රතිපාදන ලබා දුන් අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය |
|---|---|---|---|
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| බුද්ධශාසන හා ආගමික කටයුතු අමාත්‍යාංශය | 5.38 | 4.91 | 0.46 |
| ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය | 302.95 | 240.43 | 62.52 |
| ජන සන්නිවේදන හා තොරතුරු තාක්ෂණ අමාත්‍යාංශය | 150.00 | 97.57 | 52.43 |

| | | | |
|---|---|---|---|
| රාජ්‍ය පරිපාලන සහ ස්වදේශීය කටයුතු අමාත්‍යාංශය | 4.14 | 3.30 | 0.22 |
| නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය | 7.08 | 6.29 | 0.78 |
| මෝටර් රථ ප්‍රවාහන දෙපාරතමේන්තුව | 0.74 | 0.67 | 0.07 |
| කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | 32.37 | 24.15 | 8.22 |
| | --------- | --------- | --------- |
| **එකතුව** | **502.66** | **377.96** | **124.70** |
| | ===== | ===== | ===== |

## 2.2 අත්තිකාරම් ගිණුම

### 2.2.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 27001 | 55.0 | 41.4 | 30.0 | 34.5 | 183.0 | 151.6 |

## 2.3 පොදු තැන්පත් ගිණුම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම් ශේෂය රු.30,325,935 ක් විය.

## 2.4 විගණන නිරීක්ෂණය

2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ 1.1 ඡේදයේ දක්වා ඇති පරිදි කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් නිරීක්ෂණ 3 ඡේදයේ දක්වා ඇත.

## 3. ශීර්ෂ 270 - අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

-----------------------------------------------

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

-------------------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පහත දැක්වෙන ලේඛන යාවත්කාලීන කර පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. |
| (ආ) | ඇප ලේඛනය | මුදල් රෙගුලාසි 891(1) |

### 3.2 විගණන විමසුම්වලට පිළිතුරු දීම

----------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 02 කට 2015 මාර්තු 31 දින වන විටද පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණු අතර, එම විමසුම්වලට අදාල ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු.4,029,682 ක් විය.

### 3.3 පොදු තැන්පත් ගිණුම

----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 2 ක් ඉක්ම වූ එකතුව රු.1,740,481 ක්වූ තැන්පතු 140 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) 2014 වර්ෂයේ වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් විවිධ කාර්යයන් සඳහා ලබාදී තිබුණු රු.124,702,421 ක ප්‍රතිපාදනවලින් අදාල කාර්යය භාරයන් ඉටු නොකර එම ප්‍රතිපාදන වියදම් ලෙස ගිණුම්ගත කර තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

(ඇ) පදියතලාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට 2013 හා 2014 වර්ෂවල විවිධ අමාත්‍යාංශවලින් ලද ප්‍රතිපාදන එකතුව රු.81,754 ක් විගණිත දිනය වන 2015 මාර්තු 20 දින වන විටත් අදාල කාර්යයන්වල උපයෝජනය නොකර වියදම් ලෙස ගිණුම්ගත කර තැන්පතු ගිණුමේ රඳවා තිබුණි.

**3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 27001 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2014 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් සිදුකළ නියැදි පරීක්ෂාවේදී එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.1,008,256 ක් වී තිබුණි. එම හිඟහිට ශේෂ වර්ෂ 1 ක සිට වර්ෂ 8 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණත්, එම හිඟහිට ණය ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

**3.5 වත්කම් කළමනාකරණය**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) අඩ්ඩාලච්චේන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නොරොච්චෝලේ නිවාස යෝජනා ක්‍රමයට අදාළ ඉඩමේ (King Abdulla Model Town) ඉදිකිරීමේ කටයුතු සඳහා සවි කිරීමට ලබාගෙන තිබුණු විදුලි උපකරණ හා නානකාමර අයිතමයන් සවි නොකර වර්ෂ 04 ක පමණ කාලයක සිට නිෂ්ක්‍රීයව පැවැතුණි.

(ii) 2012 වර්ෂයේ අනුරාධපුර ඔයාමඩුව දැයට කිරුළ භූමියෙන් ඉවත්කර අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ලබාදෙන ලද පාවිච්චි කළ හැකි තත්ත්වයේ පවතින AC යන්ත්‍ර 13 ක් විගණිත දිනය වන 2014 නොවැම්බර් 09 දින වන විටත් භාවිතයට ගැනීමකින් තොරව ගබඩාවේ නිෂ්ක්‍රීයව පැවතිණි.

(iii) දිසාපති කාර්යාලය විසින් 2014 ජූලි, අගෝස්තු, සැප්තැම්බර් හා ඔක්තෝබර් මාසවලදී මිලදී ගන්නා ලද ජල ටැංකිවලින් රු.2,110,250 ක් වටිනා ජල ටැංකි 219 ක් නිකුත් කිරීමකින් තොරව කාර්යාල පරිශ්‍රයේ හා පිටත ඇති ගබඩාවල පැවතිණි.

**(ආ) බාහිර පාර්ශවයන් වෙත ලබාදී තිබුණු වත්කම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් දීර්ඝ කාලයක් මුළුල්ලේ නිල නිවාස 07 ක් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරින් හෝ සේවයින් නොවන වෙනත් පාර්ශවයන් වෙත මුදල් අයකර ගැනිමකින් තොරව ලබා දී තිබුණි.

## 3.6 අනුකූල නොවීම්

**(අ) නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසි යනාදියට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (i) මුදල් රෙගුලාසි 138 | 1,204,359 | කල්මුණේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් බලයලත් නිලධාරියෙකු විසින් වියදම සහතික නොකළ ගෙවීම් වවුචර් 10 ක් මගින් එකතුව රු.1,204,359 ක් ගෙවා තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 137 හා 138 | 1,682,215 | පදියතලාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ලබා ගෙන නොතිබුණු සේවාවන් වෙනුවෙන් 2014 දෙසැම්බර් 31 දින එකතුව රු.1,682,215 ක් වටිනා චෙක්පත් 05 ක් ලියා අත රඳවා ගෙන තිබුණි. |

**(ආ) කොන්ත්‍රාත් සම්බන්ධයෙන් බදු අයකර ගැනීම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සහ දමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කොන්ත්‍රාත් සඳහා ගෙවීම් කිරීමේදී එකතු කළ අගය මත බදු (VAT) සඳහා ලියාපදිංචි

වී තිබුණත්, 2014 වර්ෂය වන විට එම ලියාපදිංචිය අක්‍රිය වූ කොන්ත්‍රාත්කරුවන්ට පිළිවෙළින් රු.383,634 ක සහ රු.134,399 ක එකතු කළ අගය මත බදු (VAT ) වශයෙන් ගෙවා තිබුණි. මෙම කොන්ත්‍රාත්කරුවන් එකතු කළ අගය මත බදු (VAT ) වෙනුවෙන් අක්‍රීය ලියාපදිංචිකරුවන් බව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2014 නොවැම්බර් 11 දිනැති ලිපියකින් සනාථ කර තිබුණි. එම මුදල 2014 දෙසැම්බර් 31 දින වන විටත් අයකරගෙන නොතිබුණි.

**3.7 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පළාත් නැඟුම ව්‍යාපෘතිය යටතේ කාරතිව් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කෘෂි හා සුළු පරිමාණ ව්‍යාපාර නඟා සිටුවීමට රු.2,511,231 ක් වටිනා උපකරණ අයිතම 567 ක් 2014 දෙසැම්බර් මාසයේදී මිලදී ගෙන තිබුණු අතර, විගණිත දිනය වන 2015 මැයි 28 දින වන විටත් එම උපකරණ ප්‍රතිලාභීන්ට බෙදාදී නොතිබුණි.

(ආ) කල්මුණ අල්/මදීනා විද්‍යාලයට පරිගණකාගාරයක් ඉදිකිරීම සඳහා කල්මුණ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත රු.1,990,752 ක ප්‍රතිපාදන සළසා තිබුණු අතර ඒ වෙනුවෙන් 2014 පෙබරවාරි 25 දින රු.357,866 ක අතිරේක මුදලක්ද ලබා දී තිබුණි. අදාල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව කල්මුණ අල්/ මදිනා විද්‍යාලයේ පාසල් සංවර්ධන සමිතියට පවරා තිබුණි. එම කොන්ත්‍රාත් ගිවිසුම අනුව අදාළ ඉදිකිරිම් 2013 දෙසැම්බර් 15 දින සම්පූර්ණ කළ යුතු වූවත්, ගිවිසුම් කාලය අවස්ථා දෙකකදී දීර්ඝ කර තිබුණි. ඒ අනුව 2014 නොවැම්බර් 10 දින නිම කළ යුතුව තිබුණි. විගණන දිනය වූ 2015 මාර්තු 31 දින වන විටත් එම ඉදිකිරීම සම්පූර්ණ කර නොතිබුණි. අදාළ පාසල් සංවර්ධන සමිතියට මෙවැනි ඉදිකිරිම් කිරිමට අවශ්‍ය දැණුමක් නැති බව පාසලේ විදුහල්පතිවරයා විසින් ප්‍රකාශ කර තිබුණි. මේ අනුව ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමේ දී ප්‍රමාණවත් විමර්ශනයක් සිදු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**3.8 කාර්යසාධනය**

පරිවාස හා ළමාරක්ෂක දෙපාර්තමේන්තුවේ 2014 ජුලි 18 දිනැති අංක PCC/2/2/1/Ampara දරන ලිපිය මඟින් ළමා අපචාර හා කාර්යා හිංසනය පිටුදැකීම සඳහා වූ වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා කාරතිව් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට රු.130,000 ලබාදී තිබුණි. අදාල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමකින් තොරව එම මුදල නැවත එම අමාත්‍යාංශය වෙත ආපසු යවා තිබුණි.

**3.9 කළමනාකරණ දුර්වලතා**

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් කළමනාකරණ දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) උහන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට 2014 වර්ෂයේදී විවිධ අරමුණු ඉටුකිරීම සඳහා එකතුව රු.68,084 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. එම ප්‍රතිපාදන අදාල අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා යොදා නොගෙන එම ප්‍රතිපාදන තැන්පතු ගිණුමේ රඳවා තිබීම.

(ආ) උහන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2013 හා 2014 වර්ෂවලදී එකතු කරන ලද ව්‍යාපාර නාම ලියාපදිංචි ගාස්තු, වැලි ප්‍රවාහන ගාස්තු හා සුරාබදු බලපත්‍ර ගාස්තු වශයෙන් එකතුව රු.270,612 ක් අදාල අදායම් ගිණුම්වලට බැර නොකර තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(ඇ) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කැබ් රථයක් අළුත්වැඩියාව සඳහා රු.328,690 ක් ඇස්තමේන්තුවක් පිළියෙල කර අනුමැතිය සඳහා 2013 දෙසැම්බර් 13 දින රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම් වෙත යවා තිබුණි. 2014 දෙසැම්බර් 31 දින වන විටත් කාර්යාලය විසින් ඒ සම්බන්ධව කිසිදු ක්‍රියා මාර්ගයක් නොගෙන වර්ෂ එක හමාරක් පමණ කාලයක් එම කැබ් රථය පෞද්ගලික ගරාජයක ගාල්කර තිබුණි.

(ඈ) පදියතලාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2014 දෙසැම්බර්, 2015 ජනවාරි හා පෙබරවාරි මාසයන්හිදී මූල්‍ය සහනාධාර හා ආබාධිත ආධාර වෙනුවෙන් ලියනු ලැබූ රු.180,485 ක් වටිනා චෙක්පත් 22 ක් භාරදීමට හෝ තැපැල් කිරීමට කටයුතු නොකර මාස 03 කට ආසන්න කාලයක් අත රඳවා ගෙන තිබුණි. ඒ සම්බන්ධයෙන් අධීක්ෂණ නිලධාරීන්ගේ අවධානය යොමුකර නොතිබුණි.

**3.10 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2014 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | අතිරික්ත සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 08 | 08 | - |
| (ii) | තෘතියික මට්ටම | 01 | 01 | - |
| (iii) | ද්විතියික මට්ටම | 48 | 57 | 09 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 13 | 31 | 18 |
| | **එකතුව** | **70** | **97** | **27** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විධිමත් අනුමැතියක් ලබාගැනීමකින් තොරව ප්‍රාථමික මට්ටමෙ සේවකයින් 18 දෙනෙක් බඳවා ගෙන තිබුණි.